වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2023



හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
இந்துசமய, கலாசார அலுவல்கள் திணைக்களம்
Department of Hindu Religious and Cultural Affairs



වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

4 වන මහල, 180, ටී.බී. ජායා මාවත, කොළඹ - 10

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 204

අන්තර්ගතය

පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	- කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව

ඡායාරූප පෙළ

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ හින්දු ආගමික කටයුතුවලට අදාලව සියලුම විෂයන්ට වගකිවයුතු දෙපාර්තමේන්තුවක් ලෙස 1985 ඔක්තෝම්බර් 02 දිනැති අංක (1985/123-12) දරණ අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත 1986 වන වර්ෂයේ ජනවරි මස පළමුවන දින පිහිටුවන ලදී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණ

දැක්ම

ආදර්ශමත් යහපත් චරිතයකින් යුත් හින්දු සමාජයක් කරා...

මෙහෙවර

නවක්‍රම කණ්ඩායම් සේවය හා සමාජීය සහයෝගය මගින් විශිෂ්ඨ අනුග්‍රහක මධ්‍ය සැලසුම් ලබාදීම මගින් හින්දු ආගම ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය සහ විදහා පෑම

අපගේ වටිනාකම්

- දේශය සඳහා වූ සේවය
  අප ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ කොටසකි. අපි ඉතා කැපවීමකින් අවංකව විශිෂ්ඨත්වයෙන් හා කාර්යක්ෂමව ක්‍රියා කරන්නෙමු.
- විශිෂ්ඨත්වය සඳහා වූ ඇති උද්යෝගය
  අපගේ ක්‍රියාවන් සියල්ලක්ම වාගේ ඉතා විශිෂ්ඨව පැවතිය යුතුයි යනු අපගේ අරමුණ වේ.
- සමාජය ගොඩනැගීම
  අපගේ ප්‍රජාව අප ඉතා ගෞරවයෙන් සලකන අතර විස්වාසනීය කණ්ඩායමක් ලෙස ගොඩ නැගෙමු.
- දැඩි විශ්වාසය දිරි ගැන්වීම
  මහජනතාවගේ විශ්වාසය දිරිගැන්වීමට අපි ඉතා විශ්වාසවන්ත ලෙසද වෘත්තිය නිපුණතාවයෙනුත් අවංකවද සේවය කරන්නෙමු.
- ස්ථාවර නව ක්‍රමයක්
- අපි නිරන්තර ප්‍රගතිය හා පරිවර්තනයන් කරා ඉදිරියට පිය නගමු.

අරමුණ

- සදාචාරාත්මක ගුණාත්මක ලෙස සහ හින්දු ආගමික අගය තුලින් හින්දු ළමුන් අතර හින්දු ආගම් අධ්‍යාපනය දිරි ගැන්වීම.
- හින්දු ආගම හා සංස්කෘතිය රැක ගැනීම උදෙසා හින්දු ආගම් පරිපාටිය සංරක්ෂණය කිරීම.
- හින්දු ආගම හා සංස්කෘතිකය සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හින්දු ආගමික කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිලිබඳ උසස් සිතුවිලි මහජනයා අතර පැතිර වීම.
- දමිළ කලාකරුවන්ගේ සහභාගිත්වය මගින් දමිළ කලාවන් ආරක්ෂාකර එය ප්‍රවර්ධනය කිරීම හා එය අනාගත පරපුර වෙත භාරදීම.
- හින්දු චාරිත්‍ර පදනම් වූ සංස්කෘතිය, සමාජ, ආගම් හා ආධ්‍යාත්මික වර්ධන විධිවිධාන සඳහා හින්දු කෝවිල් හා හින්දු සංවිධානයන් දිරි ගැන්වීම.

1.3 ප්‍රධාන කාර්ය

අදාල සංවිධාන

1.3.1 ලියාපදිංචි කිරීම හා යාවත්කාලීනය

- හින්දු කෝවිල්
- හින්දු ආගමික සංවිධාන හා සමාජීය ආයතන
- හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල්
- හින්දු ආගමික හා දමිළ කලාවට අයත් සංවිධාන හා වෙනත් සමාජ ආයතනයන්

1.3.2 1985 වර්ෂයේ අංක 31 දරණ හින්දු සංස්කෘතික අරමුදල් පනත යටතේ ස්ථාපිත වූ හින්දු සංස්කෘතික අරමුදල පරිපාලනය කිරීම හා නියාමනය කිරීම.

1.3.3 හින්දු ආගමික ක්‍රියා මාර්ගයට අදාළ අන්තර් ජාතික සම්බන්ධතාවයන් පහසු කිරීම හෝ ලිහිල් කිරීම.

- හින්දු ආගමික පූජකවරුන් හින්දු ආගමික පැවිදි අය කලාකරුවන් හා හින්දු ආගමික සේවකයින්ට වීසා සම්බන්ධ නිර්දේශ කිරීම හා අදාළ ක්‍රියාවන් මෙහෙය වීම.
- වන්දනා ගමන් හා ආගමට අදාල වෙනත් කටයුතු සඳහා පහසුකම් සැළසීම හා නිර්දේශ කිරීම.

1.3.4 හින්දු පූජකතුමන් හා හින්දු ආගමික වැඩිහිටියන්ගේ සේවාවන් ප්‍රමුඛතාවය ලබා දීම මුල් කර ගෙන විශේෂ හැදුනුම්පත් නිකුත් කිරීම හා හින්දු දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ගේ අරනෙරි අධ්‍යාපන ක්‍රමය පහසු කිරීම උදෙසා හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ට විශේෂ හැදුනුම්පත් නිකුත් කිරීම.

1.3.5 හින්දු ආගමික දහම් (අරනෙරි) අධ්‍යාපනය දිරි ගැන්වීම.

- හින්දු ආගමික දහම් (අරනෙරි) පාසල් සඳහා වූ පාඨමාලාවන් හදුන්වා දීම හා ප්‍රතිසංස්කරණය.
- දහම් (අරනෙරි) පාසල් ක්‍රමවත් හා සුමටව පවත්වාගෙන යාමට උපදෙස් හා මග පෙන්වීම ලබාදීම.
- දහම් (අරනෙරි) පාසල්වල අධ්‍යාපනයට අවශ්‍ය පොත්පත් හා භාණ්ඩ නොමිලේ ලබා දීම.
- දහම් (අරනෙරි) ගුරුවරයින්ගේ හා අදාල පාසල් පරිපාලන සංවිධානයේ නිපුණතාවයන් ප්‍රවර්ධනයට උචිත අන්දමට අඛණ්ඩව නිපුණතා වර්ධනය ප්‍රවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- දහම් (අරනෙරි) පාසල් ගුරුවරුන්ට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නොමිලේ නිල ඇදුම් ලබා දීම.
- යෝග අභ්‍යාස පන්නිගෙ වැනි දහම් (අරනෙරි) විශේෂ පාඨමාලා සඳහා දායකත්වය ලබා දීම.

1.3.6 හින්දු ආගමික පර්යේෂණ ක්‍රියා මාර්ගයන් දිරි ගැන්වීම.

- හින්දු ආගම් චාරිත්‍රයට අදාල ප්‍රකාශන ඉදිරිපත් කිරීම එසේම ලබාගත් දුර්ලභ ග්‍රන්ථ නැවත සංස්කරණය කිරීම.
- හින්දු ආගම සම්බන්ද පර්යේෂණ සේවාවන් ප්‍රකාශන මගින් දිරි ගැන්වීම.
- අන්තර් ජාතික හා දේශිය විද්වතුන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ හා සංවාද පැවත්වීම.
- දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන්නාවූ පුස්තකාල මගින් පැරණි ග්‍රන්ථ පිලිබඳ ලේඛනයන් නොමිලයේ ලබා ගැනීමේ පහසුකම් ලබාදීම.

1.3.7 පහත සඳහන් විෂයන් සඳහා දේශිය රිතියට අනුකුලව තෘෂාග ප්‍රදානය කිරීම මගින් දිරි ගැන්වීම හා එය බලාත්මක කිරීම.

- විශිෂ්ඨ නිර්මාණ ශක්තිය හෙළිදරව් කරන්නාවූ දහම් (අරනෙරි) පාසල් සිසුන්ට දේශිය නිපුණතා කුසලාන ලබාදීම පිරිනැමීම.
- විශිෂ්ඨ ලෙස කටයුතු කරන්නාවූ දහම් (අරනෙරි) පාසල්වලට හා එහි සේවය කරන ගුරුවරුනට දේශිය සේවා විශිෂ්ඨත්වය සඳහා තෘෂාග ප්‍රදානය කිරීම.
- දමිළ කලාවන්ට ගෞරවයක් ලෙස සේවය ලබාදුන් ජෙෘෂ්ඨ කලාකරුවන් සඳහා කලාභූෂණ සම්මාන ප්‍රදානය ලබා දී ගෞරව කිරීම.
- හින්දු ආගම හා පාරම්පරික කලාව සම්බන්ධ කලාකරුවන් හදුනාගෙන ඔවුනට තෘෂාග ප්‍රදානය කර ගෞරවය පිරිනැමීම.

1.3.8 සංවර්ධන සේවාවන්ට අවශ්‍ය අරමුදල් ලබා දීම.


- කෝවිල් නිර්මාණ හා ඉදිකිරීම් අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබාදීම.
- මහජනතාවගේ අධ්‍යාත්මික ජීවන ප්‍රවර්ධන කටයුතු සඳහා ක්‍රියා කිරීම.
- කෝවිල් පුන්කලස් අභිෂේක හා අන් විශේෂ පුජා කටයුතු සඳහා ආධාර මුදල් ලබා දීම.
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් සඳහා ගොඩනැගිලි අරමුදල් හා යටිතල පහසුකම්, ඉදිකිරීම කටයුතු සඳහා ආධාර මුදල් ලබාදීම.
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල්වලට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ආධාර මුදල් ලබා දීම.

1.3.9 හින්දු ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තෙම්න්තුව යටතේ ලියාපදිංචි කර ඇති කෝවිල් හා ආගමික ආයතනවල ඇතිවන්නාවූ ආරවුල් නිරාකරණය කිරීම.

1.3.10 හින්දු ආගමික සංස්කෘතික අධ්‍යාපන ආයතනය මගින් හින්දු ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තෙම්න්තුව යටතේ ලියාපදිංචි කර ඇති ආයතන සඳහා නිපුණත්ව ප්‍රවර්ධන වර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම.

- හින්දු ආගමික පුජකවරුන් සඳහා ධාරිතා ප්‍රවර්ධනය
- හින්දු ආගමික කෝවිල් හා හින්දු ආගම් ආයතන පරිපාලන සංවිධානවල නිපුණතාවය ප්‍රවර්ධන සැලසුම්
- දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් ගුරුවරුන් හා දහම් අධ්‍යාපන (අරනෙරි) පාසල් පාලකයින් සඳහා නිපුණතා ප්‍රවර්ධන අභ්‍යාස

1.4 ආයතන ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන අංශ

පහත සඳහන් කරන ලද ආයතනයන්ගේ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය සඳහා ද දෙපාර්තමේන්තුවේ සේවාවන් විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක කිරීමටත් පහත දැක්වෙන අත්‍යවශ්‍ය අංශ දෙපාර්තමේන්තුව විසින් පිහිටුවා ඇත.

- පරිපාලන අංශය
- මුදල් අංශය
- හින්දු කෝවිල් අංශය
- හින්දු ආගමික කටයුතු අංශය
- හින්දු දහම් අධ්‍යාපන (අරනෙරි) අංශය
- හින්දු පර්යේෂණ අංශය
- හින්දු සංස්කෘතික අරමුදල් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයතන පහත සඳහන් පරිදි

හින්දු ආගමික සංස්කෘතික අධ්‍යාපන ආයතනය

- සර් පොන් රාමනාදන් අභ්‍යාස ස්ථානය, කොළඹ 04
- ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් අභ්‍යාස ස්ථානය, යාපනය
- ස්වාමි විපුලානන්දර් පුහුණු මධ්‍යස්ථානය, මඩකලපුව

- හින්දු විශ්‍රාම ශාලාව, කතරගම
- නැගෙනහිර පළාත් ප්‍රාදේශිය කාර්යාලය, හින්දු සංස්කෘතික කේන්ද්‍රය, නාවට්කුඩා, මඩකලපුව.
- ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් මණිමණ්ඩබම්, යාපනය
- උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලය, ගුරුකුලම්, ආනෙපන්ති, යාපනය

1.7 දෙපාර්තමේන්තුවේ "SWOT" විශ්ලේෂණය

1.7.1 ශක්තීන්

- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති අතර මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වන පරිදි රජයේ ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක වේ.
- දෙපාර්තමේන්තුව "අ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අතර වෙනම අයවැය යටතේ වෙනම ප්‍රතිපාදන වෙන් කර තිබීම.
- දෙපාර්තමේන්තුව විසින් රටතුල වෙසෙන සියලුම හින්දු ආගමික ප්‍රජාව වෙත සේවා සැපයීම.
- දෙපාර්තමේන්තුව මහජනතාවට සේවා සැපයීම සඳහා හින්දු දහම් පාසල් අධ්‍යාපන අංශය, හින්දු ආගමික කටයුතු අංශය, හින්දු කෝවිල් අංශය, පර්යේෂණ අංශය වැනි විවිධ අංශ පිහිටුවා ඇත.

1.7.2 දුර්වලතා

- සියලුම තනතුරුවල පුරප්පාඩු පවතින අතර වැදහත් වශයෙන් මාණ්ඩලික මට්ටමේ ඇති පුරප්පාඩු සඳහා සේවාවක් සැපයීමේ දී දුෂ්කරතාවයට මුහුණ දීමට සිදු වී ඇත.
- දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය නොමැති වීම.
- මහජනතාව හා කාර්ය මාණ්ඩලය සඳහා වාහන නැවැත්වීමේ පොදු පහසුකම් නොමැතිවීම.

1.7.3 අවස්ථාවන්

- දෙපාර්තමේන්තුවට සියලුම හින්දු සංවිධාන, හින්දු කෝවිල් සහ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති හින්දු දහම් පාසල් සමඟ අන්තර් සබඳතාවක් ඇති කර ඇත.
- එකම ගොඩනැල්ලේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් ආගමික දෙපාර්තමේන්තු පිහිටා ඇති බැවින් ආගමික වැඩසටහන් එක්ව සංවිධානය කිරීමට හා ආගමික සහජීවනයක් ඇති කිරීමටත් උපකාර වී ඇත.

1.7.4 තර්ජනයන්

- දෙපාර්තමේන්තුව සඳහා නීතිමය පනතක් නොමැති වීම.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රටේ පවතින ආර්ථික අවිනිශ්චිතතාවයෙන් එල්ල වූ අභියෝග මධ්‍යයේ ගෙවී ගිය වසරක් වන 2023 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවට මෙම පණිවිඩය එක් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කටයුතුවලින් අපේ රටේ හින්දු මහජනතාව මිලියන 2.5 ක් ප්‍රතිලාභ ලබමින් සිටි. 2023 වර්ෂයේදී රජයේ ජාතික ප්‍රතිපත්තියට අනුගත වන ව්‍යාපෘති සහ වැඩසටහන් තුළින් බලාපොරොත්තු වූ සැලකිය යුතු ප්‍රතිඵල කාර්යක්ෂම හා ඵලදායී ලෙස ළඟා කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ගිය වර්ෂයේ පැවති රටේ ආර්ථික අස්ථාවරත්වයේ බලපෑම හේතුවෙන් යම් යම් බාධාවන් ඇති වුව ද දෙපාර්තමේන්තුවේ වැදගත් අරමුණු අනුව 2023 දී සැලකිය යුතු ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. තව ද, දෙපාර්තමේන්තුවට වාර්ෂිකව වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනවලින් 85%ක් ඉලක්කගත අරමුණු සඳහා වැය කිරීමෙන් වැදගත් සංවර්ධන ඉලක්ක ඵලදායී ලෙස නිම කර ඇත.

2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රවල සැලකිය යුතු වර්ධනයක් කරා ළඟා වීමට සමත් වී ඇත. හින්දු දහම් පාසල් සංවර්ධනය, හින්දු ආගමික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය, හින්දු ආගම හා සංස්කෘතිය පිළිබඳ පර්යේෂණ, හින්දු සංස්කෘතිය සහ කලා ප්‍රවර්ධනය කිරීම සහ හින්දු කෝවිල් සහ හින්දු ආයතන වල සැලකිය යුතු සංවර්ධනයක් ඇති විය. ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කරන කාලය තුළ මෙම දෙපාර්තමේන්තුව මුහුණ දෙන අභියෝග බොහෝය. එම අභියෝග අතර කාර්ය මණ්ඩල හිඟය හා අරමුදල් ලැබීමේ ප්‍රමාදවීම ප්‍රධාන අභියෝග විය. එසේම දෙපාර්තමේන්තුව බම්බලපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලේ සිට ටී.බී. ජයා මාවත, කොළඹ -10 නව ගොඩනැගිල්ලට 2023 මැයි මසවල නව ගොඩනැගිල්ලට මාරු කර ඇත. නව ගොඩනැගිල්ලේ අසම්පූර්ණ පහසුකම් සහිතව තමන්ගේ රාජකාරි ඉටුකිරීමට නිලධාරීන් විවිධ ගැටලුවට මුහුණ දීමට සිදුවිය.

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව රජයේ ප්‍රතිපත්තියට අනුකූලව දැහැමි, විනය ගරුක සහ නීතිගරුක සමාජයක් කරා ඉදිරියට යාමට සැලසුම් කර ඇත, මෙම ඉලක්කයට අනුගත වෙමින් හින්දු භක්තිකයන්, විශේෂයෙන්ම හින්දු දරුවන් අතර සදාචාරාත්මක හා ආගමික වටිනාකම් ප්‍රගුණ කිරීම සඳහා හින්දු ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

අවසාන වශයෙන් 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සැලසුම් සහගත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා ලබාදුන් සහයෝගය වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාවෙත සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතාට ස්තුතිය පුද කරමි. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනාගත ඉලක්කය වන්නේ දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන්හි වඩාත් ගුණාත්මක විශිෂ්ඨ සේවාවක් ලබා දෙමින් ආදර්ශවත් ගුණවත් හින්දු සමාජයක් ගොඩනැගීමයි.

වයි. අනිරුත්තනන්
අධ්‍යක්ෂ
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2023 දෙසැම්බර් 31 දිනෙන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

Statement of Financial Performance
for the period ended 31st December 2023

Revised Budget Allocations 2023 Rs.		Note	Actual 2023 Rs.	Actual 2022 Rs.	
-	**Revenue Receipts**		-	-	
-	Income Tax	1	-	-	
-	Taxes on Domestic Goods & Services	2	-	-	ACA-1
-	Taxes on International Trade	3	-	-	
-	Non Tax Revenue & Others	4	-	-	
-	**Total Revenue Receipts (A)**		-	-	
-	**Non Revenue Receipts**		-	-	
-	Treasury Imprests		218,346,000	210,749,000	ACA-3
-	Deposits		1,585,170	5,587,391	ACA-4
-	Advance Accounts		7,204,962	5,380,272	ACA-5
-	Other Main Ledger Receipts				
-	**Total Non Revenue Receipts (B)**		**227,136,132**	**221,716,663**	
	Total Revenue Receipts & Non Revenue Receipts C = (A)+(B)		**227,136,132**	**221,716,663**	
	Remittance to the Treasury (D)		**6,378,450**	**869**	
-	**Net Revenue Receipts & Non Revenue Receipts E = (C)-(D)**		**220,757,682**	**221,715,794**	
	Less: Expenditure				
-	**Recurrent Expenditure**				
105,100,000	Wages, Salaries & Other Employment Benefits	5	92,975,985	91,589,589	
71,650,000	Other Goods & Services	6	59,502,874	60,044,681	ACA-2(ii)
81,250,000	Subsidies, Grants and Transfers	7	40,215,278	38,750,866	
-	Interest Payments	8	-	-	
-	Other Recurrent Expenditure	9	-	-	
258,000,000	**Total Recurrent Expenditure (F)**		**192,694,137**	**190,385,136**	
	Capital Expenditure				
2,500,000	Rehabilitation & Improvement of Capital Assets	10	2,451,314	2,295,493	
1,500,000	Acquisition of Capital Assets	11	1,000,750	1,377,800	
-	Capital Transfers	12	-	-	ACA-2(ii)
-	Acquisition of Financial Assets	13	-	-	
1,000,000	Capacity Building	14	551,751	275,960	
31,000,000	Other Capital Expenditure	15	31,000,000	31,000,000	
36,000,000	**Total Capital Expenditure (G)**		**35,003,815**	**34,949,253**	
	Deposit Payments		3,219,795	4,547,077	ACA-4
	Advance Payments		5,731,968	3,092,221	ACA-5
	Other Main Ledger Payments		-	-	
	Total Main Ledger Expenditure (H)		**8,951,763**	**7,639,298**	
	Total Expenditure I = (F+G+H)		**236,649,715**	**232,973,687**	
294,000,000	**Balance as at 31st December J = (E-I)**		**(15,892,033)**	**(11,257,893)**	
	Balance as per the Imprest Adjustment Statement		(15,892,033)	(11,257,893)	ACA-7
	Imprest Balance as at 31st December		-	-	ACA-3
			(15,892,033)	**(11,257,893)**	

3.2 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ACA-P

Statement of Financial Position
As at 31st December 2023

	Note	Actual 2023 Rs	2022 Rs
Non Financial Assets			
Property, Plant & Equipment	ACA-6	159,099,465	158,098,715
Financial Assets			
Advance Accounts	ACA-5/5(a)	16,041,724	17,514,717
Cash & Cash Equivalents	ACA-3	-	-
Total Assets		**175,141,189**	**175,613,432**
Net Assets / Equity			
Net Worth to Treasury		15,594,913	15,333,281
Property, Plant & Equipment Reserve		159,099,465	158,098,715
Rent and Work Advance Reserve	ACA-5(b)	-	-
Current Liabilities			
Deposits Accounts	ACA-4	446,811	2,181,436
Unsettled Imprest Balance	ACA-3	-	-
Total Liabilities		**175,141,189**	**175,613,432**

Detail Accounting Statements in ACA format Nos. 1 to 7 presented in pages from ……1…. to…51… and Annexures to accounts presented in pages from …52…. to …59…….. form an integral part of these Financial Statements. The Financial Statements have been prepared in complying with the Generally Accepted Accounting Principles whereas most appropriate Accounting Policies are used as disclosed in the Notes to the Financial Statements and hereby certify that figures in these Finacial Statements, Notes to accounts and other relevant accounts were reconciled with the Treasury Books of Accounts and found in agreement.

We hereby certify that an effective internal control system for the financial control exists in the Reporting Entity and carried out periodic reviews to monitor the effectiveness of internal control system for the financial control and accordingly make alterations as required for such systems to be effectively carried out.

Chief Accounting Officer
Name :
Designation :
Date :

Samarathne Vidanapathirana
Secretary
Ministry of Buddhasasana, Religious & Cultural Affairs
No. 135, "Dahampaya"
Srimath Anagarika Dharmapala Mw.,
Colombo - 07.

Accounting Officer
Name :
Designation :
Date : 15/02/2024

Y. Aniruthanan
Director
Department of Hindu Religious and Cultural Affairs
4th Floor,
No. 180, T.B. Jayah Mawatha, Colombo-10

Chief Financial Officer/ Chief Accountant/
Director (Finance)/ Commissioner (Finance)
Name :
Date : 15/02/2024

V. Diroshana
Accountant
Department of Hindu Religious and Cultural Affairs
4th Floor,
No. 180, T.B. Jayah Mawatha, Colombo-10

3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් වූ වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය

Statement of Cash Flows
for the Period ended 31st December 2023

	Actual	
	2023 Rs.	2022 Rs.
Cash Flows from Operating Activities		
Total Tax Receipts	-	-
Fees, Fines, Penalties and Licenses	-	-
Profit	-	-
Non Revenue Receipts	9,334,990	7,502,845
Revenue Collected on behalf of Other Revenue Heads	-	
Imprest Received	218,346,000	210,749,000
Recoveries from Advance	1,517,720	36,950
Deposit Received	1,536,420	5,534,691
Total Cash generated from Operations (A)	**230,735,130**	**223,823,486**
Less - Cash disbursed for:		
Personal Emoluments & Operating Payments	143,117,219	136,581,455
Subsidies & Transfer Payments	40,215,253	38,750,291
Expenditure incurred on behalf of Other Heads		6,049,905
Imprest Settlement to Treasury	6,378,450	869
Advance Payments	4,265,671	2,944,811
Deposit Payments	1,754,847	4,547,077
Total Cash disbursed for Operations (B)	**195,731,440**	**188,874,408**
NET CASH FLOW FROM OPERATING ACTIVITIES(C)=(A)-(B)	**35,003,690**	**34,949,078**
Cash Flows from Investing Activities		
Interest	-	-
Dividends	-	-
Divestiture Proceeds & Sale of Physical Assets	-	-
Recoveries from On Lending	-	-
Total Cash generated from Investing Activities (D)	-	-
Less - Cash disbursed for:		
Capital Expenditure	35,003,690	34,949,078
Total Cash disbursed for Investing Activities (E)	**35,003,690**	**34,949,078**
NET CASH FLOW FROM INVESTING ACTIVITIES(F)=(D)-(E)	**(35,003,690)**	**(34,949,078)**
NET CASH FLOWS FROM OPERATING & INVESTMENT ACTIVITIES (G)=(C) + (F)	-	-
Cash Flows from Fianacing Activities		
Local Borrowings	-	-
Foreign Borrowings	-	-
Grants Received	-	-
Total Cash generated from Financing Activities (H)	-	-
Less - Cash disbursed for:		
Repayment of Local Borrowings	-	-
Repayment of Foreign Borrowings	-	-
Total Cash disbursed for Financing Activities (I)	-	-
NET CASH FLOW FROM FINANCING ACTIVITIES (J)=(H)-(I)	-	-
Net Movement in Cash (K) = (G) + (J)	-	-
Opening Cash Balance as at 01st January	-	-
Closing Cash Balance as at 31st December	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

   2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත.

   අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය.

   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

   2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම්	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලිය	4,000,000	4,000,000	7,447,380	186
2002-02-99	පොළිය හා වෙනත්	500,000	500,000	597,843	119
2003-99-00	වෙනත් ලැබීම්	600,000	600,000	3,297,757	549
2004-01-00	සමාජ ආරක්ෂණ සඳහා දායකත්වය (මධ්‍යම රාජ්‍ය)	-	-	3,810,267	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		ත්‍යාග වියදම්	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූලික ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	258,000,000	258,000,000	192,694,137	75
ප්‍රාග්ධන	36,000,000	35,500,000	35,033,815	97

3.7. මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		ත්‍යාග වියදම්	උපයෝගිකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මූල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	දුම්රිය දෙපාර්තමේන්තුව	ප්‍රවේශ පත්‍ර	682,550	682,550	682,550	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	73,700,000	73,700,000		
9152	යන්ත්‍රෝපකරණ	39,399,465	39,399,465		
9153	ඉඩම්	46,000,000	46,000,000		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීඒඒ/සී/ඩීඑච්ආර්/02/2023/11 මගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 ජූනි 14 දින

අධ්‍යක්ෂ
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 204- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලන්යන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගත යුතු වුවත් රාජ්‍ය ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2019 ජනවාරි 22 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ අංක KF 9142 දරන වාහනයේ අයිතිය නිරවුල් කර වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.	1.6.2 (අ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන චක්‍රලේඛය ප්‍රකාරව වියදම් සීමා කිරීමෙන් අනතුරුව වැය විෂයයන් 8 කට අදාළව සියයට 13 ත් 77 ත් අතර ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරිකිරීම් පවතින බව නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) රාජ්‍ය ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2019 ජනවාරි මාසයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහනයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් පාවිච්චි කළ නොහැකි බවට හඳුනාගත් ස්ථාවර වත්කම් අයිතම 7 ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩුකර දැක්වීමට ද කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2023 වර්ෂයට අදාළව 2024 වර්ෂයේ ගෙවීම් කරන ලද වැය විෂයයන් හතරකට අදාළ එකතුව රු.1,322,716 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් යටතේ පෙන්නුම් කර නොතිබුණු අතර CIGAS වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද සමුච්චිත බැඳීම් හා බැරකම් වාර්තාව, හිස් වාර්තාවක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම්වලට නොඑළඹිය යුතු වුවත් වැය විෂයය අංක 1101 - ගමන් වියදම් (දේශීය) සඳහා සලසා තිබුණු රු.2,000,000 ක ප්‍රතිපාදනයෙන් ඉතිරි වූ රු.121,510 ක් ඉක්මවා රු. 333,232 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම

සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) වගන්තිය	අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4, 4.5, 4.6 සහ 6.3 උපවගන්ති	සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු වසර 01ක කාලයක සිට හිඟහිටව පවතින රු.220,300 ක ආපදා ණය ශේෂය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 29 කට අධික කාලයක සිට හිඟහිටව පවතින රු.46,462 ක ණය ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනයේ දැනට භාවිතයේ පවතින සංචිත වාහන 03 ට අදාළ ධාවන සටහන් නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ)	2020 අගෝස්තු 28 දින හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලසි 756(6)	2023 දෙසැම්බර් 15 දිනට පෙර සිදු කළ යුතු 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම 2024 ජනවාරි සහ මාර්තු මාසවල සිදු කර තිබුණි. 2023 ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2023 අගෝස්තු 10 දින ඉදිරිපත් කර තිබුණු අතර ඊට අදාළ පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් අප්‍රේල් 30 දිනට පෙර සුදුසු පරිදි කටයුතු කිරීම මෙම වාර්තාවේ දිනය දක්වාම සිදු කර නොතිබුණි

(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධයෙන් අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවෙහි සියළුම වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර වාහන සම්බන්ධ 2023 වර්ෂයේ මාසික ප්‍රවාහන සේවා සටහන්, ඉදිරිපත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

මු.රෙ.395 (ඇ) ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කර ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර ප්‍රමාද වී ඉදිරිපත් කර තිබූ අතර එම ප්‍රකාශන දින රහිතව අත්සන් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් අදාළ අනුමැතිය ලබා නොගෙන එම සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

අභ්‍යන්තර වාර්තාවල පිටපත් කළමණාකාර විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ නියමිත කාලය තුළ සිදු කර තිබීම, සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා

සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම, වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කිරීම, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම, නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර විගණනයට ඉදිරිපත් කිරීම, සහ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාලය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම යනාදී ඉටුකළ යුතු කරුණු ඉටුකර නොතිබුණු නමුත් ඒවා නිසි ලෙස ඉටුකර ඇති බවට සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර තිබුණි.

3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු අධ්‍යක්ෂ, ගණකාධිකාරි, රියදුරු ඇතුළු නිලධාරීන්ගෙන් ඇප අය කර ගෙන ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වසර 20 කට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කර තිබුණු නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කුරුකුලම් ආනපන්දි උපකාර්යාලය පිහිටා ඇති ගොඩනැඟිලි සහ ඊට අදාළ භූමිය යාපනය මහ නගර සභාවෙන් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර ඊට අදාළව යාපනය මහාධිකරණයේ නඩුවක් විභාගවෙමින් පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් කෝවිල් සඳහා මූල්‍යාධාර ලබා දීමට අදාළව කෝවිල් තෝරා ගැනීම, ලබාදෙන ආධාර මුදල් ප්‍රමාණය හා ප්‍රමුඛතාව යනාදී කරුණු ඇතුළත් කර අනුමත කර ගනු ලැබූ නිර්ණායක සහ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් සත්‍ය වශයෙන්ම ආධාර අවශ්‍ය වන කෝවිල් හඳුනාගෙන ඒවාට මූල්‍යාධාර ලබා දී ඇති බව නිරීක්ෂණය නොවිය.

(ඇ) 2022 (2023) වර්ෂය සඳහා වූ ජාතික නිර්මාණ තරඟාවලියේ දහම් පාසැල් මට්ටම, ප්‍රාදේශීය මට්ටම දිස්ත්‍රික්ක මට්ටම සහ ජාතික මට්ටමට අදාළ තරඟ රු. 4,310,630 ක වියදමකින් 2023 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ පවත්වා, ප්‍රතිඵල නිකුත් කර තිබුණ ද, ඊට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් මෙම වාර්තාවේ දිනය වන විටත් සිදු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 184 ක් වූ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 19 ක් පුරප්පාඩු වී පැවතුණු අතර ඒ තුළ නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ තනතුරු 3 ක්, පරිපාලන නිලධාරී තනතුර, පුස්තකාලයාධිපති තනතුර, දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු තනතුර, කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 09 ක් සහ ප්‍රථමික මට්ටමේ

තනතුරු 04 ක් ඇතුළත් විය. තනතුරු පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අඩු වීම කෙරෙහි බලපෑ හැකි බවට නිරීක්ෂණය කෙරේ.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියකුටම වෙනත් සේවා ස්ථානයක සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වූවත් 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක සිට වර්ෂ 35ක් දක්වා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 117 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එම්.එම්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

1.0 හින්දු අරනෙරි දහම් පාසල් ප්‍රවර්ධනය / සංවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	ප්‍රයෝජනය ලබාගත් අය	මූල්‍ය ප්‍රතිපාදන 2023 (රු මිලි)	මූල්‍ය රු මිලි	%	ප්‍රයෝජනය ලබාගත් අයවරුන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම
1.1	හින්දු දහම් පාසල් සිසුන් සඳහා පවත්වන පන්නිශෙ හා යෝගා පන්තිය	4000 සිසුන්	2.60	2.31	89%	4,200 සිසුන්	*100%*
1.2	දහම් පාසල් සිසුන් සඳහා ජාතික නිර්මාණශීලි තරග පැවැත්වීම හා සම්මාන ප්‍රදානය කිරීම.	50,000 සිසුන්	4.15	4.14	100%	1500 සිසුන්ට සම්මානය ප්‍රදාන කරන ලදි	*100%*
1.3	හින්දු දහම් පාසල් සිසුන් සඳහා හින්දු ආගමික පොත් සහ සංගීත භාණ්ඩ මිලදී ගැනීම හා ලේඛණ මුද්‍රණය කිරීම හා බෙදා හැරීම	2,000 සිසුන්	1.80	1.70	94%	2000 පොත් 30 සංගීත භාණ්ඩ	*100%*
1.4	හින්දු දහම් පාසල් සිසුන් සඳහා නව විෂය මාලාවක් ක්‍රියාත්මක කිරීම(පෙළපොත් මුද්‍රණය කිරීම හා බෙදා හැරීම)	50,000 සිසුන් හා ගුරුවරු	7.63	6.36	83%	45,500 පොත්	*100%*
1.5	හින්දු දහම් පාසල් අධ්‍යාපන සඳහා දැනුවත් කිරීම වැඩ සටහන්	10,000 සිසුන් හා ගුරුවරු	3.50	3.35	96%	20 වැඩ සටහන්	*100%*
1.6	හින්දු දහම් පාසල් හා ගුරුවරුන් සඳහා සම්මාන ප්‍රදානය කිරීම හා ගෞරව කිරීම	250 දහම් පාසල් 250 ගුරුවරු	1.00	0.00	0%	---	2024 වර්ෂයේ පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවති
1.7	හින්දු දහම් පාසල් ගුරුවරුන්ගේ පුහුණුව	4,500 ගුරුවරුන්	3.00	2.45	82%	20 වැඩ සටහන්	*100%*
1.8	දහම් පාසල් ගුරුවරුන් සඳහා වූ මාසික දීමනාව	5000 ගුරුවරුන්	28.02	24.43	87%	4884 ගුරුවරුන්	*82%*
1.9	හින්දු දහම් පාසල් අවසාන හා ධර්මාචාර්ය විභාග ය පැවැත්නීම						
	1) හින්දු දහම් පාසල් අවසාන විභාග	10,000 සිසුන්	*6.00*	*4.92*	*82%*	විභාගය පැවැත්වී ඇත.	*100%*
	2) ධර්මාචාර්ය විභාග		*30.92*	*0.00*	–	විභාගය නොපැවැත්වී ඇත.	-
	එකතුව		88.62	49.66	56%		

2.0 හින්දු කෝවිල් හා ආයතන සංවර්ධනය කිරීම

අංකය	ක්‍රියාකාරකම	ප්‍රයෝජනය ලබාගත් අය	මූල්‍ය ප්‍රතිපාදන 2023 (රු මිලි)	මූල්‍ය රු මිලි	%	ප්‍රයෝජනය ලබාගත් අයවරුන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම
2.1	හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම	හින්දු ජනතාවට හා කෝවිල් 150	24.50	24.50	100%	157 කෝවිල්	100%
2.2	හින්දු කෝවිල්වල යටිතල පහසුකම් සපුරාදීම සඳහා ආධාර ලබා දීම	50 කෝවිල්	4.50	4.50	100%	50 කෝවිල්	100%
2.3	හින්දු සිසුන් සඳහා අධ්‍යාපන මූල්‍යාධාර ලබා දීම	1500 හින්දු සිසුන්	3.64	3.64	100%	1,456 හින්දු සිසුන්	100%
2.4	හින්දු කෝවිල් හා ආයතනය සඳහා මූල්‍යාධාර ලබා දීම	5000 හින්දු ජනතාව	3.56	3.56	100%	44 හින්දු කෝවිල් හා ආයතනය	100%
2.5	නන්දි කොඩිය මුද්‍රණය කිරීම හා බෙදාහැරීම	හින්දු ජනතාව	0.80	0.80	100%	11,300 කොඩි	100%
2.6	නාවලර් සංස්කෘතික ශාලාවට මූල්‍යාධාර ලබා දීම.	විශේෂ ව්‍යාපෘති	10.00	10.00	100%	විශේෂ ව්‍යාපෘති	100%
2.7	සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම සඳහා "නල්ලෙයි තිරුඥානසම්බන්දන් ආදීනම්" නඩත්තු කිරීම.	10,000 හින්දු ජනතාව හා අරනෙරී සිසුන්	0.60	0.60	100%	10,000 හින්දු ජනතාව හා අරනෙරී සිසුන්	80%
2.8	ප්‍රදේශීය මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	50,000 හින්දු ජනතාව	7.00	6.99	100%	නඩත්තු වියදම	100%
2.9	හින්දු අරමුදල් දායකත්වය	විශේෂ ව්‍යාපෘති	0.40	0.40	100%	විශේෂ ව්‍යාපෘති	100%
	එකතුව		**55.00**	**54.99**	**100%**		

3.0 හින්දු ආගමික හා සංස්කෘතික ප්‍රවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	ප්‍රයෝජනය ලබාගත් අය	මූල්‍ය ප්‍රතිපාදන 2023 (රු මිලි)	මූල්‍ය රු මිලි	%	ප්‍රයෝජනය ලබාගත් අයවරුන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම
3.1	හින්දු උත්සව හා ගුරුපූජා පැවැත්වීම	හින්දු ජනතාව	2.10	2.08	99%	25 වැඩසටහන්	100%
3. 2	ආගමික දැනුවත් කිරීමේ වැඩසටහන (ගුවන්විදුලි)	දේශීය විදේශීය හින්දු ජනතාව	4.10	3.94	96%	52 වැඩසටහන්	100%
3.3	අධ්‍යාත්මික ප්‍රවර්ධන කිරීමේ මූලික හා උසස් පාඨමාලාව	60 දේශකයන්	1.10	1.04	95%	68 දේශකයන්	100%
3.4	දිව්‍ය ගම්මාන වැඩ සටහන් හා ආගමික සහජීවන ව්‍යාපෘති පැවැත්වීම	මහජනතාව	1.00	0.82	82%	10 වැඩසටහන්	100%
	එකතුව		**8.30**	**7.88**	**95%**		

4.0 හින්දු ආගමික පර්යේෂණ පැවැත්වීම

අංකය	ක්‍රියාකාරකම	ප්‍රයෝජනය ලබාගත් අය	මූල්‍ය ප්‍රතිපාදන 2023 (රු මිලි)	මූල්‍ය රු මිලි	%	ප්‍රයෝජනය ලබාගත් අයවරුන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම
4. 1	හින්දු ආගමික පොත් මුද්‍රණය කිරීම	හින්දු මහජනතාව	4.00	3.03	76%	8000 පිටපත්	100%
4.1	හින්දු ආගමික පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම.	5,000 මහජනතාව හා පර්යේෂණකරුවන්	2.50	2.48	99%	සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශණය-03ක්	100%
	එකතුව		**6.50**	**5.51**	**85%**		

5.0 හින්දු දමිළ කලා සංස්කෘතික ප්‍රවර්ධනය

අංකය	ක්‍රියාකාරකම	ප්‍රයෝජනය ලබාගත් අය	මූල්‍ය ප්‍රතිපාදන 2023 (රු මිලි)	මූල්‍ය රු මිලි	%	ප්‍රයෝජනය ලබාගත් අයවරුන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම
5.01	සංස්කෘතික වැඩසටහන පැවැත්වීම හා කලාකරුවන්ට ගෞරව කිරීම (කලාභූෂණ සම්මාන හා දෙමළ නඩුවන් සඳහා සම්මාන)	50 කලාකරුවන්	**0.50**	**0.44**	87%	15 කලාකරුවන්	100%
5.04	ශ්‍රී ලංකා කර්තෘවරුන්ගෙන් හින්දු දෙමළ පොත් මිලදී ගැනීම	25 ලේඛකයන්	**0.40**	**0.25**	77.1%	20ලේඛකයන්	80%
	එකතුව		**0.90**	**0.69**	77%		

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
ඉලක්කය 16. තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ලන්ගෙන් සමන්විත ප්‍රජාවන් ප්‍රවර්ධනය කිරීම හා සැමට යුක්තිය ඉටු කිරීම සහ සියලු මට්ටම්වල කාර්යක්ෂම හා වගකිවයුතු ක්‍රියාකාරී ආයතන පිහිටුවීම.	ඉලක්කය 16.6: සියලු මට්ටම්වල කාර්යක්ෂමතා , ගිණුම්කරණ වගකිවයුතු සහ විනිවිද පෙනෙන සමාගම් ඇති කිරීම.	දර්ශකය 16.6.1: අංශය විසින් අනුමත කරන ලද අයවැයෙන් (හෝ අයවැය දර්ශක (වියදම් ශීර්ෂයන්) හෝ ඊට සමාන) ප්‍රාථමික රජයේ වියදම්			85%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ඉහත දර්ශකය රජයේ අයවැය සැලසුම්වල විශ්වසනීයත්වය පවත්වා ගැනීමට උත්සාහ කරයි. රජයන් තමන් අපේක්ෂා කරන දේ සඳහා වියදම් කරන්නේද සහ ඔවුන් රැස් කිරීමට අදහස් කරන අරමුදල් රැස් කරන්නේද යන්නී සෑම මට්ටමකින්ම කාර්යක්ෂම, වගවීම සහ විනිවිද පෙනෙන සමාගම් බිහිකිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විශිෂ්ටත්වය ලබාගෙන ඇත. වාර්ෂික අයවැය හරහා අංක 204 දරණ ප්‍රධාන වියදම් ශීර්ෂය හරහා 2023 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට ලබා දී ඇති රුපියල් මිලියන 294 න් රුපියල් මිලියන 227.70 ක් ඵලදායී ලෙස වියදම් කර ඇත.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක සංඛ්‍යාව	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යා	ඇබෑර්තු /(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	06	04	02
තෘතීයික	01	--	01
ද්විතියික	155	145	10
ප්‍රාථමික	22	16	06
	184	165	19

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය බලපා ඇති ආකාරය.

ආයතනයක කාර්යසාධනය මනිනු ලබන්නේ එම ආයතනයේ ඵලදායිතාව හෝ ප්‍රතිඵල අනුව එහි අපේක්ෂිත ප්‍රකාශන හෝ අරමුණු හා ප්‍රතික්‍රියා මගින් දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වන අතර සංවිධානයේ වැඩ ප්‍රමාණය අඩු කරන අතර එමඟින් ආයතනයේ වර්ධනය ප්‍රවර්ධනය වන අතර ආයතනයේ සේවකයින්ට ප්‍රතිලාභ ලැබේ.

2023 වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 184 ක් විය. දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (හින්දු කෝවිල හා හින්දු කටයුතු) සහ පරිපාලන නිලධාරී යන තනතුරු මුළු වර්ෂය තුළ පුරප්පාඩු විය.

2023 වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සංඛ්‍යාව 19 ක් වූ අතර 2022 වන වර්ෂවලත් එම සංඛ්‍යාව 24 ක් විය.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
සාමාන්‍ය කාර්යාල පරිපාටිය	15	දින 3	141,430.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාලය ක්‍රියා පරිපාටිය.
මූල්‍ය කළමනාකරණය	15			-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාලය ක්‍රියා පරිපාටිය
නායකත්වය පුහුණු වැඩ සටහන්	50	දින 3	300,000.00	-	දේශීය	නායකත්වයේ ගුණාත්මකය ප්‍රවර්ධන කර ඇත.
පාලන කළමනාකරණ පුහුණුව	25	දින 1	30,500.00	-	දේශීය	වැඩිදියුණු කළ කාර්යාලය ක්‍රියා පරිපාටිය

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය.

ආයතනයේ ප්‍රගතිය සඳහා වඩාත් කාර්යක්ෂම හා බුද්ධිමත් මෙහෙයුම් කාර්ය මණ්ඩලය අත්‍යවශ්‍ය වේ. පුහුණුව ලබා දීම සේවක ඵලදායිතාව ඉහළ නංවන අතර සේවකයාගේ සේවය වැඩි දියුණු කරයි. ආයතන තුළ ධනාත්මක වෙනසක් ඇති කරයි. පුහුණුව අපැහැදිලි තොරව තිබෙන විෂයන්වල බලපෑම ඇති කර ස්ථීරභාවය ලබා දෙයි.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව වසර පුරා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීය. දෙපාර්තමේන්තුවට අනුබද්ධ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා ඔවුන් විවිධ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන අතර අඛණ්ඩ අධීක්ෂණය කර ඇත.

අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර මහජනයාට සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ හැකියාව වැඩි කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ සමස්ත පද්ධතියම ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව සංවර්ධනය කිරීමේ ප්‍රවේශයක් කරා යොමු කිරීම සහ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින සියලුම නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පරිපාලන ශාඛාව කටයුතු කරයි.

වෙනත් ක්‍රියාකාරකම් පුහුණු ප්‍රවේශයන් හඳුනා ගැනීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම සහ බාහිර ආයතන හරහා කාර්ය මණ්ඩල පුහුණු අවස්ථා ලැබීමට අදාළ ක්‍රියාකාරකම්, එම ප්‍රවේශයට සරිලන පරිදි මානව සම්පත් වැඩසටහන් වලට අදාළ පුහුණු කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන තුළින් හඳුනාගත් නිපුණතා අනුව ගැලපීම මගින් තෝරාගෙන පුහුණු කිරීම් කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව මුහුණ දෙන පුහුණුව හා සංවර්ධනයේ ඇති ප්‍රධාන අභියෝගයක් වන්නේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලීම සඳහා වෙනත් පුහුණු සපයන්නන් සේවාව මත අවශ්‍ය වේ. පුහුණු සපයන්නන් සමඟ සමීප හා නිරන්තර සම්බන්ධතා පවත්වා ගැනීම උපකාරී වේ.

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		

2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6.	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ජා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිතයි
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම පිළබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්	අනුකූලවේ		

	ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛණයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104.109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූලවේ		
12	**රජයේ නිලධාරන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයට වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		අංක 01/2020 හා 2020.08.20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව රු.25,000/- යටතේ ඇති රාජ්‍ය නිලධාරීන්ගේ අත්තාකාරම් ගිණුමේ හිග ශේෂයන් ඉවත් කිරීම සඳහා අයදුම්පත් යවයි.
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මොහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා	අනුකූලවේ		
	හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම	අනුකූලවේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6,5ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූලවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූලවේ		

ඡායාරූප පෙළ

තෙපොංගල් උත්සවය - නුවර එළිය දිස්ත්‍රික්කය





නිදහස් දින සැමරුම - කොළඹ දිස්ත්‍රික්කය





සිවරාත්‍රී උත්සවය - කළුතර දිස්ත්‍රික්කය





ජාතික වෙසක් උත්සවය - පුත්තලම දිස්ත්‍රික්කය





හින්දු අරනෙරි සිසුන් සඳහා නිර්මාණාත්මක තරඟය - අම්පාර දිස්ත්‍රික්කය





යාපනය දිස්ත්‍රික්කයේ යෝගා පන්තිය සහ ආධ්‍යාත්මික ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුවක් ලබා ඇති සිසුන් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය - යාපනය දිස්ත්‍රික්කය





දිව්‍යමය වැඩසටහන - යාපනය දිස්ත්‍රික්කය





ජාත්‍යන්තර යෝග දිනය - අම්පාර දිස්ත්‍රික්කය





2023 වසරේ පැවති ජාතික දීපාවලි උත්සවය වෙනුවෙන් මුද්දරය නිකුත් කිරීම වවුනියාව දිස්ත්‍රික්කය





ජාතික කියවීමේ මාසය වන ඔක්තෝබර් - මුලතිව් දිස්ත්‍රික්කය වෙනුවෙන් පොත් ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී





නවරාත්‍රී පූජාව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - කොළඹ





මුලතිව් දිස්ත්‍රික්කය - අරනෙරි සිසුන් සහ අරනෙරි ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන







හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

இந்து சமய கலாசார அலுவல்கள் திணைக்களம்

Department of Hindu Religious and Cultural Affairs